සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

## පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

**II පත්‍රය**

**නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන**

# "අදිති"

13

පැය 01 යි මිනි 15

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

**01. පහත දැක්වෙන ඡේදය කියවන්න.**

කොළඹ යෑමට පෙර සියලු දෙනා ම සමනොළ කන්ද නැරඹීමට කැඳවාගෙන යෑමට ආත්තම්මා තීරණය කළා ය. ඇගේ යෝජනාව අනුව අරුණගේ බාප්පා මේ නඩයට සෑහෙන බස් රථයක් සූදනම් කළේ ය. ආත්තම්මා ශ්‍රී පාදස්ථානය ගැන ළමයින්ට කරුණු කියා දී තිබිණි. ඒ නිසා ළමා, තරුණ වැඩිහිටි කොයි කවුරුත් ආත්තම්මාගේ අණ පිළිපැද ගමන ආරම්භ කළ හ. ''පලක් නැති දේ කතා කිරීම ඇගට ගුණ නැහැ'' කියා ආත්තම්මා ළමයින්ට කිවුවා ය. ඒ නිසා කවුරුත් අනවශ්‍ය දේ කතා කිරීමට බිය වූහ. මේ පාර කපා ඇත්තේ ඝන කැලෑවක් මැදින් යැයි තාත්තා කිවේ ය.

- **ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

i. ආත්තම්මා තීරණය කළේ කුමක් නැරඹීමට යෑමට ද? ........................................................................

ii. මෙම ගමනට සහභාගි වූයේ කවුද?..................................................................................................

iii. ''කණ්ඩායම '' යන අර්ථය දීමට ඡේදයේ යොදා ඇත්තේ කුමක් ද?..........................................

iv. ගමන යෑමට බස් රථය සූදනම් කළේ කවු ද?....................................................................................

v. ආත්තම්මා ළමයින්ට දුන් උපදේශය කුමක් ද?..................................................................................

vi. ඡේදයේ යෙදී ඇති මහප්‍රාණ අක්ෂරයක් සහිත වචනයක් තෝරා ලියන්න.

..............................................................

**02. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.**

පාලමක් / කඩොල් / පෙළ / වැන්න / ගස්

..................................................................................................................................................................

**03. වර්තමාන කාල බහුවචන ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

1) කියයි. 2) යති. 3) කළ හ

**04. පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

1) i. එළවළු ii. එලවලු iii. එළවලු

2) i. විශිෂ්ඨ ii. විශිෂ්ට iii. විෂිශ්ට

**05. පහත සඳහන් කවියේ ඇති උපමාව තෝරා ලියන්න.**

ගස් අස්සෙන් තීරු තීරු
එන හිරු රැස් සාරි වගෙයි
අම්මට දෙන්නට හිතුණත්
අල්ල ගන්න බැරි ගාන යි

..................................................................................................................................................................

**06. පහත සඳහන් වාක්‍ය ඒක වචන අතීත කාලයට හරවා ලියන්න.**

මව්වරු රසවත් ආහාරයක් පිළියෙල කරති.

..................................................................................................................................................................

07. **'ප්‍රවෘතිය' යන්නට සමාන පදය ලියන්න.**

.................................................................................................................................................

08. **පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ඉඟි වැකිය ලියන්න.**

ඉටු නොවන සිහින මැවීමක දී කියයි.

.................................................................................................................................................

09. **ගැළපෙන විරාම ලකුණු යොදන්න.**

**එතැනයි මගේ මාලිගාව දිව්‍ය ලෝකය වනය පාසල**

10. **පහත සඳහන් වැකිවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් ✓ ලකුණු ද වැරදි × නම් ලකුණු ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

i. මුවෙක් වතුර බොයි (............)

ii. කිරිල්ලිය කෑම සෙව්වේ ය. (............)

iii. ගංගා ගලා බැස්සේ ය. (............)

iv. ගොවියා කුඹුරට ගිය හ. (............)

11. **පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.**

i. විහිළු - ..........................................

ii. .................................. - සෙල්ලම්

12. **පහත සඳහන් අවස්ථාවල ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉර මත ලියන්න.**

දුක් මහන්සියෙන් කළ වැඩක ප්‍රතිඵලයක් නොලැබීම.

.................................................................................................................................................

13. **රූපයේ ඊතල මගින් පෙන්වා ඇති ශාරීරික කොටස් ඉංග්‍රීසි භාෂාවෙන් යෙදෙන ආකාරයට සම්පූර්ණ කරන්න.**




14. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

i. paddy field - .......................................................

ii. postman - .......................................................

15. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

i. give / please / your /me /pencil - ......................................................................

ii. is / This / our / bus / School - ......................................................................

16. i. ''නූලහම්'' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

..........................................................................................................

ii. පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

නංගිලා ඉන්නවා - ...........................................................................

- **පිළිතුරු සපයන්න.**

17. සංඛ්‍යා රටාවේ ඊළඟ සංඛ්‍යාව ලියන්න.
    8020, 8010 , 8000, 7990, ....................

18. පහත දී ඇති සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.
    67039 : ...............................................................................

19. ගණක රාමුවේ නිරූපිත සංඛ්‍යාවෙන් 9ක් අඩු කිරීමෙන් ලැබෙන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.




.....................................

20. 1 11 16 6 10 5

    කොටුවේ ඇති සංඛ්‍යා සුදුසු පරිදි යොදාගෙන පොදු අන්තරය 5වන සංඛ්‍යා රටාව ගොඩ නගන්න.
    ............................ , ............................ , ................................ , 16

21. ඇපල් ගෙඩි 816 ක් එක් ළමයෙකුට ගෙඩි 4 බැගින් බෙදා දුන්නේ නම් ඇපල් ලැබුණු ළමයින් ගණන සොයන්න. ................................................................................

22. ඔෂධ ගමනකින් $\frac{3}{4}$ක් බසයෙන් ගොස් ඉතුරු දුර යතුරු පැදියකින් ගියේය. යතුරු පැදියෙන් ගිය දුර $20km$ නම් ගමනේ මුළු දුර කොපමණ ද? ................................................................................

23. ක්‍රීඩා පිටියට ගිය තමිඳු පැය 1යි මිනිත්තු 30ක් ගත කොට ප.ව.4.20ට ඉන් පිට විය. තමිඳු ක්‍රීඩා පිටියට ගිය වේලාව කීය ද? ................................................................................

24. මෙම ත්‍රිකෝණයෙන් $\frac{3}{4}$ ක් අඳුරු කර පෙන්වන්න.



25. i. ' xix ' මෙම රෝම සංඛ්‍යාව හින්දු අරාබි සංඛ්‍යාවෙන් ලියන්න. ........................................
    ii. ' 15 ' යන හින්දු අරාබි සංඛ්‍යාව රෝම සංඛ්‍යාවෙන් ලියන්න. ........................................

26. පැණි බීම බෝතලයකට ලීටර 1ක් අල්ලයි. $225ml$ කුඩා පැණි බීම බෝතල් 4ක් ලීටරයේ බෝතලයට දැමුවේ නම් බෝතලය පිරවීමට තව පැණි බීම කොපමණ ප්‍රමාණයක් දැමිය යුතු වේ ද? ................................................................................

27. රූපයේ දැක්වෙන ඝනවස්තුවට සමාන කළ හැකි පරිසරයෙන් ගත හැකි වඩාත් සුදුසු දේවල් 2ක් ලියන්න.



1. ....................................................
2. ....................................................

28. පැය 24 ඔරලෝසුවේ 00:45 ලෙස පෙන්වන වේලාව සාමාන්‍ය ඔරලෝසු වේලාවෙන් දක්වන්න.

...........................................................................

29. $12m$ දිග ලණුවකින් $5m\ 75cm$ ක කැල්ලක් ඉවත් කළ පසු ඉතිරි කැබැල්ලේ දිග කොපමණ ද?

...........................................................................

30. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | මිලදී ගත් ප්‍රමාණය | 1kg ක මිල | | වටිනාකම | |
|---|---|---|---|---|---|
| | | රු | සත | රු | සත |
| සීනි | 2kg 500g | 229 | 00 | i............ | ........... |
| අල | 500g | ii............. | ............... | 109 | 50 |
| | | මුළු මුදල | | 682 | 00 |

31. අ/ශාන්ත ජෝශප් මහා විද්‍යාලයේ 3D ශ්‍රේණියේ ළමයින් 38ක් සතියක් තුළ නොපැමිණි සංඛ්‍යාව පහත ප්‍රස්තාරයේ දැක්වේ. ඒ ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.




i) සතිය තුළ 3D පන්තියේ පැමිණි සිසුන් ගණන සොයන්න. ..................................................

- **අංක 32 සිට 61 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

32. අන් අයගේ ක්‍රියා කලාපය නිසා තමා පීඩාවට පත් වූ අවස්ථාවකි.

 1) පුස්තකාලයක නිශ්ශබ්දව පොත් කියවන සිසුන් සිටින අවස්ථාවක්.
 2) බැංකුවක තමාගේ වාරය එන තෙක් පෝලිමේ සිටින මිනිසුන් සිටින අවස්ථාවක්.
 3) පිරිසක් මැද අයෙක් මහ හඬින් දුරකථන ඇමතුමක් හා සම්බන්ධ වන අවස්ථාවක්.

33. දිනපතා ජලය ප්‍රමාණවත් පරිදි පානය කිරීම නිසා අපට ලැබෙන වාසියක් නොවන්නේ,

 1) වකුගඩු නීරෝගී වීම.
 2) අධික තරබාරුවක් ඇති වීම
 3) ප්‍රාණවත් සිරුරක් ලැබීම.

34. සිත් පහන් කිරීමේ ක්‍රියාකාරම් කිරීමේ දී ප්‍රාර්ථනාව යෙදෙන්නේ එහි කීවෙනි පියවර වශයෙන් ද?

1) තෙවෙනි පියවර　　2) පස්වෙනි පියවර　　3) සිව්වැනි පියවර

35. ලෝක උරුමයක් වූ සීගිරිය පිහිටා ඇති පළාත වනුයේ.

1) මධ්‍යම පළාත　　2) උතුරු මැද පළාත　　3) නැගෙනහිර පළාත

36. නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යතුමා වනුයේ,

1) විලියම් ගොපල්ලව මහතා

2) ඩී.එස්.සේනානායක මහතා

3) මහින්ද රාජපක්ෂ මහතා

37. **බට්ටා පනිමු හෙවත් කොටු පනිමු** යන ක්‍රීඩාව කිරීමේ දී ඔබ එකවර පාද තබන කොටු යුගලයක් වන්නේ,

1) 4 හා 5　　2) 6 හා 7　　3) 5 හා 6

38. පාද රහිත සතුන් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1) නයා, කිනිතුල්ලා, මකුළුවා

2) නයා, ගැරඬියා, මකුළුවා

3) නයා, ගැඩවිලා, පිඹුරා

39. බෝවන රෝගයක් වන්නේ පහත සඳහන් කුමන රෝගය ද?

1) දියවැඩියාව　　2) ඩෙංගු　　3) අධික රුධිර පීඩනය

40. බත් එතීම සඳහා යොදා ගත නොහැකි ශාක පත්‍රයකි.

1) හබරල කොළ　　2) කෙසෙල් කොළ　　3) නෙලුම් කොළ

41. ශරීර වර්ධනය සඳහා අවශ්‍ය ආහාර කාණ්ඩය පමණක් අයත් පිළිතුර වන්නේ ,

1) බත් ,මස් ,මාළු　　2) මස්, මාළු, පිට්ටු　　3) පරිප්පු, මුං ඇට, බෝංචි

42. රාජ්‍ය ලාංඡනය දැකගත නොහැකි ස්ථානයකි.

1) සුපිරි වෙළෙඳ සැල　　2) ශ්‍රී ලංකා පොලීසිය　　3) නගර සභාව

43. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය හා ජාතික වෘක්ෂය පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1) නා ගස හා මානෙල් මල

2) මානෙල් මල සහ සල්ගස

3) මානෙල් මල සහ නා ගස

44. පෙති 5ක් බැගින් ඇති මල් වර්ග සඳහන් පිළිතුර සොයන්න.

1) අරලිය - වද　　2) අරලිය - නා මල　　3) වද - රත් මල්

45. බස් රථයක පූජ්‍ය පක්ෂය සඳහා වෙන්කර ඇති ආසනය පිහිටා තිබෙන්නේ,

1) රියදුරු අසුනට පිටුපස ආසනය

2) ඉදිරිපස දොරටුව ආසන්නව ඇති ආසනය

3) ගැබිණි මාතාවන් සඳහා වෙන්කර ඇති ආසනයට පිටුපසින් ඇති ආසනය

46. **ගිරෙන් ගිරට පැන ලැගුම් සොයා පුබුදමින් අරුණ කල මා ...** යන වන්නමෙන් විස්තර වනුයේ,

1) ඇතාගේ ගමන් විලාශයයි.

2) වදුරාගේ ගමන් විලාශයයි.

3) හාවාගේ ගමන් විලාශයයි.

47. ධීවර කර්මාන්තයට පමණක් අයත් උපකරණ ඇති පිළිතුර තෝරන්න.

1) අතංගුව, මා දැල, දඹරය

2) මඬිය, අතංගුව, දියාලුව

3) අතංගුව, මා දැල, ඇලිස්කටුව

48. ලේන්සුවකට අවශ්‍ය පුංචි මලක් මසා ගැනීම සඳහා යොදා ගත හැකි විසිතුරු මැහුම් ක්‍රමයකි.

1) බිලැන්කට් මැස්ම 2) නැට් මැස්ම 3) දම්වැල් මැස්ම

49.




ඉහත සඳහන් පරීක්ෂණය තුළින් ඔබ ඉගෙන ගත් දෙය වන්නේ,

1) වර්ෂාව පොළොවට පතිත වන විට පසෙහි සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කිරීමයි.

2) අපිරිසිදු ජලය පිරිසිදු වී වැටෙන ආකාරය නිරීක්ෂණය කිරීමයි.

3) භාජනයේ පතුලේ ජලයේ පීඩනය වැඩි බව නිරීක්ෂණය කිරීමය.

50. 'සාමාන්‍ය ජලය (මිරිදිය) ට වඩා ලුණු මිශ්‍ර ජලයේ (කරදිය) යම් ද්‍රව්‍යක් වැඩිපුර පාවේ' මෙම කියමන,

1) අසත්‍යකි. 2) සත්‍යයකි. 3) කිසිවක් කිව නොහැක.

51. මිය ගිය පසු මෘත දේහය නැවීම සිදු කරනු ලබන ආගමික භක්තිකයන් වන්නේ,

1) බෞද්ධ. 2) කතෝලික. 3) ඉස්ලාම්.

52. මහවැලි, කැලණි, කළු, වලවේ යන සිව්මහ ගංගා ආරම්භ වන කන්ද කුමක් ද?

1) සමනල කන්ද. 2) පිදුරු තලාගල කන්ද. 3) බඹරකන්ද.

53.




ඉහත සඳහන් උපකරණය දැක ගත හැකි අවස්ථාවකි,

1) මාලිමාවේ. 2) අනිලමානයේ. 3) විදුලි සීනුවේ.

54. පහත දැක්වෙන්නේ ජලය සහිත බඳුනක සෘජිෆෝම් කැබැල්ලක් හෝ කිරල ඇබයක් මත දණ්ඩ චුම්බකයක් තබා ජලය මත පාවීමට සලස්වා ඇති ආකාරයයි.
මෙම පරීක්ෂණයෙන් අපි සොයා බැලුවේ,



1) උතුරු දිශාව සොයා ගැනීමයි.
2) දකුණු දිශාව සොයා ගැනීමයි.
3) චුම්බකය පාවෙන ආකාරය සොයා බැලීමයි.

55. වියළි කෝෂයක දක්නට නොලැබෙන දෙයකි.

1) ධන (+) අග්‍රය. 2) සෘණ (-) අග්‍රය. 3) සූත්‍රිකාව.

56. 

මෙම රූපයේ සිටින්නේ,

1) ආතර් සී. ක්ලාක් මහතා.
2) ඩී. බී. ජයතිලක මහතා.
3) සී. ඩබ්. ඩබ් කන්නන්ගර මහතා.

57. සුළඟ මගින් පමණක් ව්‍යාප්ත වන බීජ අඩංගු පිළිතුර සොයන්න.

1) පිළිල, අඟුණ, හොර.
2) මහෝගනී, නාගදරණ, අඟුණ .
3) අඟුණ, හොර, මහෝගනී.

58. ශ්‍රී ලංකාවේ වැඩිපුර ම ජල ගැලීම් නැමති ආපදා තත්ත්වයන්ට මුහුණ දෙන පළාතකි.

1) උතුරු මැද පළාත 2) බස්නාහිර පළාත 3) නැගෙනහිර පළාත

59. අනුරාධපුර නගරය ආසන්නයෙන් ගලා යන ගංගාවකි.

1) ජය ගඟ 2) මහවැලි ගඟ 3) මල්වතු ඔය

60. සන්නිවේදනයක ප්‍රධාන අංග ගණන වනුයේ,

1) 4 කි . 2) 3 කි. 3) 5 කි.

61. පාසලක ඉතිහාසය දැන ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් උදවු වන මූලාශ්‍රයකි.

1) පාසල් ලොග් සටහන් පොත්.
2) ශිෂ්‍ය නාම ලේඛන.
3) පාසලේ බඩු වට්ටෝරු පොත්.

62. **" මා කැමති කතා පොත"** යන්න මාතෘකාව කර ගනිමින් වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)

1) ..............................................................................................................
..............................................................................................................
2) ..............................................................................................................
..............................................................................................................
3) ..............................................................................................................
..............................................................................................................